දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කච්චේරිය, ත්‍රිකුණාමලය

மாவட்டச் செயலகம், திருகோணமலை

**District Secretariat, Kachcheri, Trincomalee**

# කාර්යසාධන වාර්තාව හා ගිණුම්

## செயற்திறன் பெறுபேற்று அறிக்கையும் கணக்கும்

# PERFORMANCE REPORT AND ACCOUNTS

**2015**



| පටුන | පිටුව |
|---|---|


1. ත්‍රිකුණාමලය දිසාපතිතුමාගේ පණිවිඩය 02
2. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳව හැඳින්වීම
   2.1. අපගේ දැක්ම හා මෙහෙවර 03
   2.2. සංවිධානයේ අරමුණු 03
   2.3. ප්‍රධාන ක්‍රියාකාරකම් 04

3. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සිතියම 05
4. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය පිළිබඳ හැඳින්වීම 06-07
5. දිස්ත්‍රික්කයේ සංඛ්‍යානමය තොරතුරු
   **5.1.** මූලික තොරතුරු 08
   **5.2.** ඉඩම් ව්‍යාප්තිය, ග්‍රාම නිලධාරි කොට්ඨාශ, සහ ජනගහනය 08-09
6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් හා සංවිධාන ව්‍යුහය
   6.1. මාණ්ඩලික නිලධාරි විස්තර 10
   6.2. කාර්යාල සංවිධාන ව්‍යුහය 11
   6.3. මානව සම්පත් (ව්‍යාපෘතිය 01 සහ ව්‍යාපෘතිය 02) 12-13

7. **සාමාන්‍ය පරිපාලන හා ආයතනික සේවා කාර්යය සාධනය**
   7.1. සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා ප්‍රගතිය
      7.1.1. බලපත්‍ර සහ අවසරපත්‍ර – (තුවක්කු, රා, අභිං, සහ පුපුරණ ද්‍රව්‍ය) 14-16
      7.1.2. විශ්‍රාම වැටුප් ගෙවීම විස්තර 16-17
      7.1.3. නිපුණතා සංවර්ධන මධ්‍යස්ථානය 17-18
      7.1.4. ප්‍රා.ලේ. කාර්යාලවල ලියාපදිංචි කටයුතු(ජා.හැ, උපත්, මරණ, විවාහ,ආදී... ) 18-19
      7.1.5. කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ ඒකකය 19-20
      7.1.6. ඉඩම් පරිපාලනය කටයුතු 20-23
      7.1.7. දිස්ත්‍රික් ඉන්ජිනේරු අංශය 23-24
      7.1.8. දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන කටයුතු 24-25
      7.1.9. කිරුම් මිනුම්, ප්‍රමිති, හා සේවා අංශය 25
      7.1.10. දිස්ත්‍රික් මෝටර් රථ කාර්යාලයේ ප්‍රගතිය 25
      7.1.11. දිස්ත්‍රික් පාරිභෝගික අංශයේ කටයුතු ප්‍රගතිය 26

   7.2. සමාජසේවා කටයුතුවල ප්‍රගතිය 27

8. **සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය**

   8.1. දිස්ත්‍රික් සැලසුම් ලේකම් කාර්යාලය 28-32
   8.2. දිස්ත්‍රික් දිවිනැගුම ලේකම් කාර්යාලය 33-34
   8.3. දිස්ත්‍රික් කෘෂිකර්ම කාර්යාලය 35
   8.4. රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ප්‍රාග්ධන වියදම් 36

9. වාර්ෂික ගිණුම් කටයුතු පිළිබඳ විස්තර 37-43

## 01. ත්‍රිකුණාමලය දිසාපතිතුමාගේ පණිවිඩය



ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එයට අනුබද්ධ අංශ සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල එකොලහක් විසින් 2015 වසර තුල ඉටු කළ මහජන සේවාවන් හා සංවර්ධන කටයුතු පාදක කරගෙන සම්පාදිත මෙම *'කාර්යසාධන හා ගිණුම් වාර්තාව 2015'* සඳහා පණිවිඩයක් සැපයීමට ලැබීම පිළිබඳ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රධාන රාජ්‍ය නිලධාරියා ලෙස මම ඉමහත් සතුටු වෙමි.

නැගෙනහිර පළාතේ දිදුලන දිස්ත්‍රික්කයක් ලෙස කෘෂිකර්මාන්තය, ධීවර කර්මාන්තය මෙන්ම තිරිඟුපිටි නිශ්පාදනය හා සිමෙන්ති නිශ්පාදනය වැනි කාර්මික අංශයෙන්ද රටේ දළ දේශිය නිෂ්පාදනය සඳහා විශාල දායකත්වයක් අප දිස්ත්‍රික්කයෙන් ලබාදෙනු ලබයි. එමෙන්ම සංචාරක කර්මාන්තය හා විනෝදාශ්වාදය සැපයීම් අංශයන්ද ඉතා සීඝ්‍රයෙන් පුළුල් වෙමින් පවතී. මෙවන් සමාජ ආර්ථික පසුබිමක්තුල දිස්ත්‍රික් රාජ්‍ය සේවාවද සුවිශේෂි කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එම කාර්යාල පරිශ්‍රයතුලම ක්‍රියාත්මක වන අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් අංශයන් මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2015 වසරේදී සිය සේවාවන් ඉටු කිරීමේදී විශාල ප්‍රගතියක් සටහන් කර ඇත. දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් හා සමාජ ආර්ථික මට්ටම ඉහළ නැංවීම අඛණ්ඩව සිදුවෙමින් තිබෙන අතර ම එය දිස්ත්‍රික් සංවර්ධන ව්‍යායාමය ඔසවා තැබීමට උපකාරී වී ඇත. එමෙන්ම මෙම සේවාවන් සැපයීමේදී කාර්යක්ෂමතාව හා ගුණාත්මක බව වර්ධනය කිරීමට ද අඛණ්ඩව උත්සුක වී ඇත.

2015 වසරතුල ත්‍රිකුණාමලය දිස්ත්‍රික් රාජ්‍ය පරිපාලන හා අනෙකුත් සංවර්ධන කටයුතුවලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා අනෙකුත් සියලු අමාත්‍යාංශවලට අයත් කාර්ය මණ්ඩලය ලබාදුන් සහයෝගය පිළිබඳව මා ඉමහත් සතුටුවෙමි. කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය සේවාවක් ලබාදීම වෙනුවෙන් වෙහෙස මහන්සී වී තම දායකත්වය ලබාදුන් සියල්ලටම මාගේ අවංක කෘතඥතාව ප්‍රකාශ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

එන්.ඒ.ඒ. පුෂ්පකුමාර,
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්,
ත්‍රිකුණාමලය.

## 2. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ හැඳින්වීම

### 2.1. අපගේ දැක්ම හා මෙහෙවර ප්‍රකාශය

**අපගේ දැක්ම**

"දිස්ත්‍රික්කයේ සියලු මහජනතාවට අවශ්‍ය සේවය කාර්යක්ෂමව හා ඵලදායිව උපරිම අන්දමින් ලබාදෙමින් ජනතාවගේ ජීවන තත්වය උසස්කරලීම"

**අපගේ මෙහෙවර**

"ජාතික සංවර්ධනය උදෙසා රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූල වූ මනා සැලැස්මකින් යුතුව සම්පත් හා ආයතන ඵලදායි ලෙස මෙහෙයවන්නා වූ සම්බන්ධීකරණයක් තුලින් දිස්ත්‍රික්කයේ ජනතා අවශ්‍යතා කාර්යක්‍ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටුකිරීම"

### 2.2. ආයතනික අරමුණු

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තම දිස්ත්‍රික් රාජ්‍ය පරිපාලන කටයුතු මූලිකවම සේවා ව්‍යාපෘති අංග දෙකක් ඔස්සේ ඉටු කරනු ලබයි. එනම්; අ). සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා, ආ). ප්‍රාදේශිය ලේකම් කාර්යාල සේවා වශයෙනි. මෙම අංශ දෙකෙහි පොදු අරමුණු වන්නේ:

- දිස්ත්‍රික් මට්ටමේ ආයතනික රාමුවක් ගොඩනැගීම මගින් රජයේ සංවර්ධන ප්‍රමුඛතාවන් ඉටුකර ගැනීම උදෙසා කාර්යක්ෂම හා ඵලදායි රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයක් බිහිකිරීම,
- රේඛිය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක කිරීම පිණිස ඔවුන් සමඟ අතිනතගෙන ක්‍රියා කිරීම,
- ආර්ථික, ආපදා කළමනාකරණ, සහනසේවා, පුණරුත්ථාපන සහ දේශිය හා විදේශිය නියෝජිතායතන සමඟ එක්ව අරඹන ලද ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධිකරණය කිරීම,
- දිස්ත්‍රික් මට්ටමේ මුල්‍ය සම්පත් හා රාජ්‍ය දේපල කළමනාකරණය කිරීම,
- දිස්ත්‍රික්කයේ මැතිවරණ කටයුතු සම්බන්ධිකරණය කිරීම,
- නිපුණතාවෙන් පිරි රාජ්‍ය සේවක සංචිතයක් දිස්ත්‍රික්කය තුල ගොඩනගාගැනීම,

## 2.3. ප්‍රධාන ක්‍රියාකාරකම්

**සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය)**

- දිස්ත්‍රික්කය තුල ප්‍රධාන රාජ්‍ය නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම,
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලනය උදෙසා ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් සම්බන්ධිකරණය කිරීම,
- අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදෙන ලද මුදල් හා සෙසු සම්පත් කළමනාකරණය කිරීම,
- දිස්ත්‍රික්කය තුල ආපදා සහනසේවා හා පුණරුත්ථාපන වැඩසටහන් පරිපාලනය කිරීම,
- ත්‍රිකුණාමලය දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධීරණය කිරීම,
- ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් උත්සව හා සිදුවීම දිස්ත්‍රික්කය තුල පැවැත්වීම,
- ආදායම් එකතු කිරීම, බලපත්‍ර හා අවසර පත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සම්බන්ධීකරණය,
- දිස්ත්‍රික් මැතිවරණ කටයුතු සම්බන්ධිකරණය කිරීම,
- කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම,

**ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

- ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුල ප්‍රධාන රාජ්‍ය නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම,
- සිවිල් ලියාපදිංචි කටයුතු සිදු කිරීම (පුද්ගල, උපත්, මරණ, විවාහ, ව්‍යාපාර ආදිය....),
- සමෘද්ධි ප්‍රතිලාභ, විශ්‍රාම වැටුප්, සහ වෙනත් සමාජ සේවා දීමනා ගෙවීම,
- වාහන ආදායම් බලපත්‍ර, ප්‍රවාහන අවසර පත්‍ර, ආදායම්/වටිනාකම් සහතික, ආදිය නිකුත් කිරීම,
- දිවිනැගුම, ගමනැගුම වැනි ජාතික සංවර්ධන වැඩසටහන් ප්‍රාදේශිය මට්ටමින් ක්රියාත්මක කිරීම,
- පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් සම්බන්ධිකරණය කිරීම,
- රේඛිය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම පිණිස ඔවුන්ට සහාය දීම,
- මැතිවරණ කටයුතු සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට සහාය දීම,
- රාජ්‍ය සේවය උදෙසා ප්‍රාදේශිය මට්ටමේ දී අවශ්‍ය වූ සෑම මොහොතකම ක්‍රියාත්මකවීම,

## 03. ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සිතියම



## 04. ත්‍රිකුණාමලය පිළිබඳව හැඳින්වීම

**සීමා මායිම**

දිගු ඓතිහාසික පසුබිමක් ඇති, ස්භාවික වරායකින් යුතු, වෙළඳ, කෘෂිකාර්මික හා ධීවර වැනි ආර්ථික කටයුතුවලින් පිරිපුන් එමෙන්ම ස්වභාව සෞන්දර්යයෙන් අනූන ස්ථානවලින් සමන්විත ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි දිස්ත්‍රික්කයකි. එය උතුරින් මුලතිව් දිස්ත්‍රික්කයෙන්ද බටහිරින් අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් සහ දකුණින් මඩකලපුව හා පොළොන්නරුව දිස්ත්‍රික්කවලින්ද මායිම් ව පිහිටා තිබේ.

**ඉතිහාසය**

ත්‍රිකුණාමලය ඉතිහාසය ස්මරණය කිරීමට අපහසු අතීතයක් දක්වා දිවයන්නකි. ලංකා ඉතිහාසයේ අනුරාධපුර යුගයේ ප්‍රකට ඉතිහාස ග්‍රන්ථ දෙකක් වන මහාවංශය හා චූලවංශය 'ගෝකණ්ණ, 'ගෝකර්ණ', සහ 'ගෝණගාමක' ලෙස ත්‍රිකුණාමලය හඳුන්වා ඇත.

**පරිපාලනය**

නැගෙනහිර පළාතේ පිහිටි ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය වර්ග කි.මී. 2,728.8ක් පුරා විහිද ඇත. එය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 11ක් හා ග්‍රාමනිලධාරී කොට්ඨාශ 230 කින් සමන්විත වේ.

**ජනගහනය**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අංශයේ 2014 සංගණනය අනුව මුළු ජනගහනය 423,181කි. එයින් 176,744 ක් මුස්ලිම්ද, 132,779 දෙමළද, 111,653 ක් සිංහලද, 2005 දෙනෙකු වෙනත් ජාතින්ද වේ.

**දිස්ත්‍රික්කයේ ස්වාභාවික සම්පත්**

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ස්වාභාවික සම්පත් රාශියකින් හා මිනිසා විසින් නිර්මිත සම්පත් රැසකින් සමන්විතය. අලංකාර දිගු වෙරළ තීරයක්, ධීවර වරායන් හා නැංගුරම්පොලවල්, ගැඹුරුදිය මෙන්ම නොගැඹුරුදිය ධීවර කර්මාන්ත පහසුකම් ස්භාවික සම්පත් කිහිපයකි. මෙහි රන්වන් පැහැති අලංකෘත දිගු වෙරළ තීර සහ කලපු රැසක් විහිදී ඇත. එක දිගට ව්‍යාප්තව ඇති වන ගහනය සමඟ වාරිකර්මාන්තයෙන් පෝෂිත කෘෂිකාර්මික භූමි දිස්ත්‍රික්කය කොළපැහැ ගන්වා තිබේ. අති පෞරාණික ආකර්ෂණීය පාරිසරික සංචාරක ස්ථාන, ඉතා දියුණු සමාජ ආර්ථික යටිතල පහසුකම්, පහසුවෙන් සැම දිසාවකටම සම්බන්ධවිය හැකි මාර්ග පද්ධතිය, රාජ්‍ය හා අනෙකුත් ආයතන සමූහයක් විසින් නිරන්තරව පවත්වාගෙන යනු ලබන සමාජ සේවාවන්, උගත් සහ ගතික ශ්‍රමබලකාය, ප්‍රධාන ජාත්‍යන්තර නාවුක මාර්ග ආසන්නයට පිහිටි පුළුල් ස්භාවික වරාය, වැඩි නිශ්පාදන ශක්‍යතාවකින් පිරිපුන් පශුසම්පත.... ආදි සියල්ලම දිස්ත්‍රික්කයේ වටිනාකම ඔසවා තැබීමට උපකාරීවනවාසේම අනෙකුත් දිස්ත්‍රික්කයන්ගෙන් කැපී පෙනීමට සාධකයක් වී ඇත.



**දිස්ත්‍රික්යේ ජනතාවගේ ජීවනෝපායයන්**

කෘෂිකර්මය සහ ධීවර කර්මාන්තය ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම්ය. වී වගාව ප්‍රධාන කෘෂි භෝගයයි. කන්තලේ වැව, වෙන්ඩ්‍රාස වැව, මොරවැව, මහදිවුල්වැව, සහ පරවිකුලම එහි ප්‍රධාන වැව්

කීපයකි. එමෙන්ම කන්තලේ. අල්ල කන්තලේ සහ මොරවැව ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘති තුනකි. පශු සම්පත් හා ගවපාලනය තවත් ප්‍රධාන ජීවනෝපායකි. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය ලොව පතළ වෙරළ තීරයකින් සහ සංචාරක ස්ථානවලින් සමන්විත වීම නිසා සංචාරක කර්මාන්තය ද තවත් ආර්ථික ක්‍රියාකාරකමකි. උපායමාර්ගික අතින් වැදගත් ස්ථානයක පිහිටීමත්, ස්භාවිකව පිහිටි වරායත් නිසා ප්‍රීමා ශ්‍රී ලංකා හා ටෝකියෝ සිමෙන්ති වැනි ජාත්‍යන්තර සමාගම් සිය නිෂ්පාදන හා බෙදාහැරීමේ මධ්‍යස්ථාන ත්‍රිකුණාමලය නගරය කේන්ද්‍ර කරගෙන පිහිටුවා තිබේ.



**මූලෝපායිකව වැදගත් පිහිටීම**

කිලෝමීටර් 50 ක පමණ දිගු වෙරළක් ඇති ත්‍රිකුණාමලය වරාය ලෝකයේ තිබෙන ස්වාභාවික වරායයන්ගෙන් ප්‍රමුඛතම එකකි. මෙම වරාය තුන් පැත්තකින් කඳුවලින් ආවරණය වී පවතින අතරම අනෙක් පැත්තෙන් දූපත් සමූහයකින් ආවරණය වී ඇත. වසර 1775 දී කුඩා ළමයෙක් වශයෙන් ත්‍රිකුණාමලයට පැමිණි ලෝඩ් නෙල්සන් සාමිවරයා මෙම වරාය ලෝකයේ තිබෙන හොඳම ස්භාවික වරාය ලෙස නම් කර ඇත. ලෝකයේ පස්වැනි ලොකුම ස්භාවික වරාය වන මෙය යුධ නාවුක හා ගමනා ගමන අංශයන්හි මූලෝපායිකව ඉතා වැදගත් ස්ථානයක් උසුලයි.

**ආකර්ෂණීය ස්ථාන**

පේදුරු කොටුවේ උතුරු කොනට මායිම්ව අඩි 360 ක උසින් පිහිටි පර්වතය ස්වාමි පර්වතය ලෙසින් ප්‍රසිද්ධය. එහි මුදුනේ තිරුකෝනේස්වර කෝවිල පිහිටා ඇත. සුප්‍රසිද්ධ බෞද්ධ සිද්ධස්ථාන වන ඓතිහාසික තිරියාය විහාරය, සේරුවාවිල විහාරය, සහ වෙල්ගම් විහාරය ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. එමෙන්ම කින්නියා මුස්ලිම් පල්ලිය සහ කතෝලික හා ක්‍රිස්තියානි පූජාස්ථාන පිහිටීම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආගමික සහජීවනය පෙන්වයි.



විවිධ වූ උෂ්ණත්වයන්ගෙන් යුතු එක ළඟ පිහිටි උණුදිය ළිං හතක් කන්නියා ප්‍රදේශයේ පිහිටා ඇත. ඇතැම් අය විශ්වාස කරන පරිදි මෙම ළිංවල ජලය ලෙඩ සුවකිරීමේ හැකියාවක් තිබේ. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය සිංහල, දෙමළ, මුස්ලිම් හා බර්ගර් යන ජාතීන්ගෙන් සමන්විතව, සාමකාමීව වෙසෙන නිහඬ භූමි ප්‍රදේශයකි.

## 5. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සංඛ්‍යානමය තොරතුරු

### 5.1 මූලික තොරතුරු

| | අංශය | විස්තරය |
|---|---|---|
| 1 | දිස්ත්‍රික්කයේ නම | ත්‍රිකුණාමලය |
| 2 | පිහිටි පළාත | නැගෙනහිර පළාත |
| 3 | භූමි පරිමාව | වර්ග කි.මී. 2728.8 (ගොඩ-2,630.8 + ජලාශ -98 ) |
| 4 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල | 1. ත්‍රිකුණාමලය (නගර කඩවත්), 2. පදවිශ්‍රීපුර, 3. ගෝමරන්කඩවල, 4. කින්නියා, 5. මුතූර්, 6. සේරුවිල, 7. කන්තලේ, 8. කුච්චවේලි , 9. මොරවැව, 10. තඹලගමුව, 11. වෙරුගල් |
| 5 | ග්‍රාම සේවා කොට්ඨාශ හා ගම්මාන | ග්‍රාම සේවා කොට්ඨාශ – 230 , ගම්මාන - 680 |
| 6 | ජනගහනය | 423,181 (2014 සංගණනය අනුව) |
| 7 | පළාත් පාලන ආයතන | <u>නගර සභා</u><br>1. ත්‍රිකුණාමලය 2. කින්නියා<br><u>ප්‍රාදේශීය සභා</u><br>1. ත්‍රිකුණාමලය (නගර කඩවත්), 2. පදවිශ්‍රීපුර, 3. ගෝමරන්කඩවල, 4. කින්නියා, 5. මුතූර්, 6. සේරුවිල, 7. කන්තලේ, 8. කුච්චවේලි , 9. මොරවැව, 10.තඹලගමුව, 11. වෙරුගල් |
| 8 | මැතිවරණ කොට්ඨාශ සහ ඡන්ද දායකයන් | අ) සේරුවිල(74,071), ආ) ත්‍රිකුණාමලය(86,982), ඇ) මූතූර් (96,008) |
| 9 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | ගරු. සුසන්ත පුංචිනිලමේ මහතා, ගරු. එම්.කේ.ඩී.එස්. ගුණවර්ධන මහතා, ගරු. ආර්. සම්බන්ධන් මහතා, ගරු. එම්.එස්. තවුෆික් මහතා, |
| 10 | පළාත් සභා නියෝජිතයෝ | නැ.පළාත් සභාවේ ආසන 10 ක් ත්‍රිකුණාමලයට වෙන්ව වී ඇත. (දෙමළ සං - 3, එජනිස – 3, ශ්‍රීලමුකො – 2, එජාප – 1, ජානිපෙ – 1) |
| 11 | පළාත් පාලන ආයතන නියෝජිතයෝ | නගර සභා 2 ක් හා ප්‍රාදේශීය සභා 11ක් සඳහා නියෝජිතයෝ 118 තේරී පත්ව ඇත |
| 12 | රා. පරි. අමාත්‍යාංශයට අයත් සංචාරක නිවාස | සංචාරක නිවාස, අංක 109, වාසස්ථාන මාවත, ත්‍රිකුණාමලය |

### 5.2. භූමි ව්‍යාප්තිය, ග්‍රාම සේවා කොට්ඨාශ සහ ජනගහනය - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

| S/N | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | වර්ග ප්‍රමාණය (වර්.කි.මී) | ග්‍රාම නිලධාරි කොට්ඨාශ | ගම්මාන ගණන | පවුල් සංඛ්‍යාව | ජනගහනය * |
|---|---|---|---|---|---|---|
| 01 | නගර හා කඩවත් | 148.0 | 42 | 112 | 27,474 | 104,810 |
| 02 | පදවි ශ්‍රීපුර | 217.1 | 10 | 29 | 3,722 | 12,705 |
| 03 | ගෝමරන්කඩවල | 285.0 | 10 | 50 | 2,906 | 8,848 |
| 04 | කින්නියා | 146.9 | 31 | 107 | 18,257 | 70,362 |
| 05 | සේරුවිල | 279.0 | 16 | 32 | 4,758 | 15,361 |
| 06 | මුතූර් | 179.4 | 42 | 106 | 18,646 | 66,900 |
| 07 | කන්තලේ | 397.3 | 23 | 62 | 14,242 | 54,877 |
| 08 | කුච්චවේලි | 313.3 | 24 | 56 | 18,257 | 36,179 |
| 09 | මොරවැව | 322.4 | 10 | 38 | 2,618 | 8,812 |
| 10 | තඹලගමුව | 244.4 | 12 | 48 | 8,862 | 31,334 |
| 11 | වෙරුගල්/ඊච්චිලම්පත්තු | 98.0 | 10 | 40 | 3,637 | 12,993 |
| | එකතුව | 2,630.8 | 230 | 680 | 115,196 | 423,181 |

*- මූලාශ්‍රය - දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන අංශය 2014

## ජනවර්ග හා ආගම් අනුව ජනගහනය

| අංකය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ජනවර්ගය | | | | ආගම | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සිංහල | දෙමළ | මුස්ලිම් | වෙනත් | බෞද්ධ | හින්දු | ඉස්ලාම් | ක්‍රිස්තියානි | වෙනත් |
| 01 | නගර හා කඩවත් | 21,619 | 67,277 | 14,325 | 1,589 | 21,262 | 51,981 | 14,418 | 12,685 | 4,464 |
| 02 | පදවි ශ්‍රිපුර | 12,704 | 1 | - | - | 12,526 | 1 | - | 178 | - |
| 03 | ගෝමරන්කඩවල | 8,882 | 26 | - | - | 8,822 | 26 | - | - | - |
| 04 | කින්නියා | 2 | 2,453 | 67,907 | - | 2 | 2,453 | 67,907 | - | - |
| 05 | සේරුවිල | 9,343 | 2,885 | 3,133 | - | 9,311 | 2,885 | 3,133 | 32 | - |
| 06 | මූතූර් | 342 | 27,039 | 39,519 | - | 342 | 24,315 | 39,519 | 2,724 | - |
| 07 | කන්තලේ | 44,169 | 1,593 | 9,022 | 93 | 44,031 | 1,544 | 9,022 | 151 | 117 |
| 08 | කුච්චවේලි | 689 | 11,249 | 23,938 | 303 | 356 | 10,366 | 23,938 | 1,521 | - |
| 09 | මොරවැව | 6,184 | 1,036 | 1,572 | 20 | 6,175 | 1,036 | 1,572 | 14 | 15 |
| 10 | තඹලගමුව | 7,779 | 6,227 | 17,328 | - | 7,727 | 5,699 | 17,328 | 580 | - |
| 11 | වෙරුගල් | - | 12,993 | - | - | - | 12,993 | - | - | - |
| | එකතුව | 111,653 | 132,779 | 176,744 | 2,005 | 110,554 | 113,299 | 176,847 | 17,885 | 4,596 |

*- මූලාශ්‍රය - දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛන අංශය 2014

## ජනවර්ග හා ආගම් අනුව ජනගහනය
## ප්‍රස්ථාරික නිරූපණය






## 6. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මානව සම්පත් හා සංවිධාන ව්‍යුහය

### 6.1. කාර්ය මණ්ඩල විස්තර - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල

**දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය නිලධාරීන් -2015**

| අ.අ | නම | තනතුර | දුරකථන අංකය |
|---|---|---|---|
| 01 | එන්.ඒ.ඒ. පුෂ්පකුමාර | දිසාපති හා දිස්ත්‍රික් ලේකම් | 026-2222235 |
| 02 | එස්. අරුල්රාසා මහතා | අතිරේක දිසාපති හා අතිරේක දිස්ත්‍රික් ලේකම් | 026-2222236 |
| 03 | එම්. කලෙයිඥානසුන්දරම් මහතා | ප්‍රධාන ගණකාධිකාරි | 026-2223555 |
| 04 | එන්. සටිකුනේෂ්වරන් මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක | 026-2050840 |
| 05 | පී. පරමේස්වරන් මිය | සැලසුම් අධ්‍යක්ෂ | 026-2221028 |
| 06 | එන්. ප්‍රදීපන් මහතා | සහකාර දිස්ත්‍රික් ලේකම් | 026-2227027 |
| 07 | පී.ඩබ්ලිව්. භාග්‍යා මිය | ගණකාධිකාරී | 026-2222233 |
| 08 | කේ. මයිල්වාගනම් මහතා | දිස්ත්‍රික් ඉන්ජිනේරු | 026-2224809 |
| 09 | පී. ගුණරත්නම් මහතා | දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ | 026-2222311 |
| 10 | කේ.ජී.ඒ.කේ පලුගස්වැව මහතා | සහකාර ඉඩම් කොමසාරිස් | 026-2222234 |
| 11 | ආර්.පී. උපාලි මහතා | සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ | 026-2050816 |
| 12 | එස්.කේ.ඩී. නෙරන්ජන් මහතා | පරිපාලන නිලධාරී | 026-2220034 |
| 13 | එච්.ජී.එස්. ප්‍රේමරත්න මහතා | පොහොර සංවර්ධන සහකාර අධ්‍යක්ෂ | 026-2050816 |
| 14 | එම්.එස්.එම් ඉක්‍රිමා මහතා | සහකාර පුපුරණ ද්‍රව්‍ය පාලක | 026-2222233 |
| 15 | කේ.එන්.ඩබ්.කේ විමලසේන මහතා | ප්‍රාදේශි කැනීම් ඉන්ජිනේරු | 026-3202411 |
| 16 | එම්.එම්.එම්. නක්ෂබී මහතා | දිස්ත්‍රික් සංඛ්‍යා ලේඛඥ | 071-8015821 |
| 17 | ඒ.ජේ. වික්‍රමසේකරන් මහතා | සහකාර අධ්‍යක්ෂ - කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 026-2222233 |
| 18 | එම්.ආර්.එල්. චන්ද්‍රාබණ්ඩාර මහතා | මෝටර් රථ පරීක්ෂක | 026-2222233 |
| 19 | ඒ. එෆ්. සදාත් මහතා | අංශභාර නිලධාරී-පාරිභෝගික සේවා අධිකාරිය | 026-2222233 |
| 20 | ඒ.එල්. අබ්දුල් අසීස් මහතා | අංශභාර නිලධාරී - කිරුම් මිණුම් අංශය | 026-2222233 |
| 21 | අලිදීන් හමීර් මහතා | සහකාර තරුණ සේවා අධ්‍යක්ෂ | 077-9689047 |

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරු - 2015**

| අ.අ | නම | ප්‍රා.ලේ. කාර්යාලය | දුරකථන අංකය |
|---|---|---|---|
| 01 | එස්. අරුල්රාජ් මහතා | ප්‍රාදේශීය ලේකම් - ත්‍රිකුණාමලය | 026-2225941 |
| 02 | වී.පී.එස්. ජිනේන්ද්‍රසේන මහතා | ප්‍රාදේශීය ලේකම් - පදවිශ්‍රීපුර | 025-2255234 |
| 03 | එම්.සී. සමරකෝන් මහතා | ප්‍රාදේශීය ලේකම් – ගෝමරන්කඩවල | 026-2255033 |
| 04 | එම්. ඒ. අනාස් මහතා | ප්‍රාදේශීය ලේකම් – කින්නියා | 026-2236235 |
| 05 | පී.ආර්. ජයරත්න මහතා | ප්‍රාදේශීය ලේකම් - සේරුවිල | 026-2251435 |
| 06 | වී. යූසුෆ් මහතා | ප්‍රාදේශීය ලේකම් – මූතූර් | 026-2238235 |
| 07 | කේ.ඩී. ප්‍රේමදාස මහතා | ප්‍රාදේශීය ලේකම් - කන්තලේ | 026-2234234 |
| 08 | පී. ධනේෂ්වරන් මහතා | ප්‍රාදේශීය ලේකම් – කුච්චවේලි | 026-2252635 |
| 09 | ඩබ්ලිව්.එම්.බී. විජයන්ත මහතා | ප්‍රාදේශීය ලේකම් – මොරවැව | 026-2225835 |
| 10 | ජේ.ශ්‍රීපති මිය | ප්‍රාදේශීය ලේකම් – තඹලගමුව | 026-2248033 |
| 11 | එම්. දයාබරන් මහතා | ප්‍රාදේශීය ලේකම් – වෙරුගල් | 060-2264681 |

## 6.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සංවිධාන ව්‍යුහය



## 6.3. මානව සම්පත් පිළිබඳ විස්තර

### දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

2015-12-31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්යය මණ්ඩලය 72 කි. එය ජ්‍යෙෂ්ඨ නිධාරීන් 7 කින්, තෘතීක නිලධාරීන් 3 කින්, ද්විතීක නිලධාරීන් 45 කින් හා ප්‍රාථමික නිලධාරීන් 17 කින් සමන්විත විය. 2015-12-31 වන දිනට නිලධාරීන් 63 ක් සේවයේ නියුතුව ඇත.

**2015-12-31 දිනට කාර්යය මණ්ඩල විස්තර**

| අ.අ. | තනතුර | සේවාව | ශ්‍රේණිය /පංතිය | වැටුප් කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | **ජ්‍යෙෂ්ඨ මට්ටම (අ)** | | | | | |
| 1 | දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ල.ප.සේ | I(විශේෂ) | එස්එල්-3-2006 | 1 | 1 |
| 2 | අතිරේක දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ල.ප.සේ | I | එස්එල්-1-2006 | 1 | 1 |
| 3 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ | I | එස්එල්-1-2006 | 1 | 1 |
| 4 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | ශ්‍රී.ල.ග.සේ | I | එස්එල්-1-2006 | 1 | 1 |
| 5 | සහකාර දිස්ත්‍රික් ලේකම් | ශ්‍රී.ල.ප.සේ | III | එස්එල්-1-2006 | 1 | 1 |
| 6 | ගණකාධිකාරී | ශ්‍රී.ල.ග.සේ | III | එස්එල්-1-2006 | 1 | 1 |
| 7 | ඉන්ජිනේරු | ශ්‍රී.ල.ඉ.සේ | III | එස්එල්-1-2006 | 1 | 1 |
| | **උප එකතුව** | | | | **7** | **7** |
| | **තෘතීක මට්ටම (ආ)** | | | | | |
| 8 | පරිපාලන නිලධාරී | රා.ක.සේවය(සුප්‍රා) | (සුප්‍රා) | එම්එන්-7-2006 | 1 | 1 |
| 9 | භාෂා පරිවර්තක | භාෂා පරි.සේව. | I | එම්එන්2006 - 6 | 1 | 0 |
| 10 | තොරතුරු තාක්‍ෂණ නිලධාරී | තො.තා. සේ | | එම්එන්-6-2006 | 1 | 0 |
| | **උප එකතුව** | | | | **3** | **1** |
| | **ද්විතීක මට්ටම (ඇ)** | | | | | |
| 11 | සංවර්ධන සම්බන්ධිකාරක | ආශ්‍රිත සේවය | I, II | එම්එන් -4-2006 | 2 | 0 |
| 12 | අයවැය සහකාර | ආශ්‍රිත සේවය | I, II | එම්එන් -4-2006 | 2 | 1 |
| 13 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | I, II, III | එම්එන් -4-2006 | 12 | 10 |
| 14 | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.ක.ස.සේවය | I, II, III | එම්එන්–2-2006 | 25 | 25 |
| 15 | සැලසුම් ශිල්පී | සැල. ශිල්.සේ. | III | එම්එන්-1- 2006 | 1 | 0 |
| 16 | තොරතුරු තාක්‍ෂණ සහකාර | තො.තා. සේ | III | එම්එන් 1-2006 | 1 | 0 |
| 17 | තාක්ෂණ නිලධාරී | තාක්. සේව. | III | එම්ටී -2 - 2006 | 1 | 0 |
| 18 | තාක්ෂණ සහකාර | තාක්. සේව. | III | එම්ටී -2 - 2006 | 1 | 1 |
| | **උප එකතුව** | | | | **45** | **37** |
| | **ප්‍රාථමික මට්ටම (ඇ)** | | | | | |
| 19 | රියදුරු | රියදුරු සේවය | II A, IIB | පීඑල්-3- 2006 | 5 | 5 |
| 20 | කාර්.සේවක සහායක | කා.සේ.ස.සේවය | I,II,III | පීඑල් -1- 2006 | 8 | 12 |
| 21 | මුරකරු | කා.සේ.ස.සේවය | II | පීඑල් -1- 2006 | 2 | 0 |
| 22 | උද්‍යාන කම්කරු | කා.සේ.ස.සේවය | II | පීඑල් -1- 2006 | 1 | 0 |
| 23 | සනීපාරක්‍ෂක කම්කරු | කා.සේ.ස.සේවය | II | පීඑල් -1- 2006 | 1 | 0 |
| | | | | | **17** | **17** |
| | **අනියම්/කොන්ත්‍රාත්/ආදේශක** | | | | | |
| | ප්‍රාථමික | | | | | |
| | කා.සේ.ස (අනියම්) | | | | - | - |
| | **උප එකතුව** | | | | **-** | **-** |
| | **මුළු එකතුව** | | | | **72** | **63** |

## ප්‍රාදේශීය ලේකම් කාර්යාල කාර්යය මණ්ඩය

ත්‍රිකුණාමලයේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක් ඇත. 2015-12-31 දිනට එහි අනුමත කාර්යය මණ්ඩය 953කි. එය ජ්‍යෙෂ්ඨ නිලධාරීන් 33කින්ද, තෘතීක නිලධාරීන් 33 කින්ද , ද්වීතික නිලධාරීන් 759 කින්ද, සහ ප්‍රාථමික නිලධාරීන් 128 කින්ද සමන්විත විය. එමෙන්ම 2015-12-31 දින වන විට නිලධාරීන් 582 දෙනෙක් සේවයේ නිරතව සිට ඇත.

### 2015-12-31 දිනට කාර්යය මණ්ඩල විස්තර

| අ.අ | තනතුර | සේවය | ශ්‍රේණිය/ පංතිය | වැටුප් කාණ්ඩය | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | **ජ්‍යෙෂ්ඨ මට්ටම (අ)** | | | | | |
| 1 | ප්‍රාදේශිය ලේකම් | ශ්‍රී.ලං.පරි. සේවය | I | එස්එල්-1-2006 | 11 | 11 |
| 2 | සහකාර ප්‍රාදේශිය ලේකම් | ශ්‍රී.ලං.පරි. සේවය | III | එස්එල්-1-2006 | 11 | 06 |
| 3 | ගණකාධිකාරී | ශ්‍රී.ලං.ගණ. සේවය | III | එස්එල්- 1-2006 | 11 | 11 |
| | **උප එකතුව** | | | | **33** | **28** |
| | **තෘතීක මට්ටම (ආ)** | | | | | |
| 4 | පරිපාලන නිලධාරී | රා.ක.ස.සේවය(සුප්‍රා) | (සුප්‍රා) | එම්එන්-7-2006 | 11 | 04 |
| 5 | ග්‍රාම නිලධාරී (පරිපාලන) | ග්‍රා.නි.සේවය(සුප්‍රා) | (සුප්‍රා) | එම්එන්-7-2006 | 11 | 09 |
| 6 | භාෂා පරිවර්තක | භාෂා පරි. සේවය | I | එම්එන්-6-2006 | 11 | 0 |
| | **උප එකතුව** | | | | **33** | **13** |
| | **ද්වීතික මට්ටම(ඇ)** | | | | | |
| 7 | සංවර්ධන සමංබන්ධීකාරක | ආශ්‍රිත සේවය | | එම්එන්-4-2006 | 11 | 01 |
| 8 | සංවර්ධන නිලධාරී | සං.නි.සේ | | එම්එන්-4-2006 | 55 | 45 |
| 9 | රාජ්‍ය කළමණාකරණ සහකාර | රා.ක.ස.සේවය | I, II, III | එම්එන්-2-006 | 419 | 189 |
| 10 | දත්ත සටහන් ක්‍රියාකරු | තොර.තාක්.සේවය | III | එම්එන්-1-2006 | 22 | 02 |
| 11 | ග්‍රාම නිලධාරී | ග්‍රාම නිලධාරී සේව | I,II,III | එම්එන්-1-006 | 230 | 185 |
| 12 | තාක්ෂණ නිලධාරී | තාක්ෂණ සේවය | III | එම්ටී-2-006 | 11 | 6 |
| 13 | තාක්ෂණ සහකාර | තාක්ෂණ සේවය | III | එම්ටී-2-006 | 11 | 9 |
| | **උප එකතුව** | | | | **759** | **437** |
| | **ප්‍රාථමික මට්ටම (ඈ)** | | | | | |
| 14 | රියදුරු | රියදුරු සේවය | II A, II B | පීඑල්-3- 2006 | 32 | 23 |
| 15 | කාර්යාල සේවක සේවය | කා.සේ.ස. සේවය | I,II,III | පීඑල්-1- 2006 | 42 | 63 |
| 16 | මුරකරු | කා.සේ.ස. සේවය | | පීඑල්-1- 2006 | 32 | 07 |
| 17 | කාර්යාල කම්කරු | කා.සේ.ස. සේවය | III | පීඑල්-1- 2006 | 11 | 08 |
| 18 | සනීපාරක්‍ෂක කම්කරු | කා.සේ.ස. සේවය | III | පීඑල්-1- 2006 | 11 | 02 |
| | **උප එකතුව** | | | | **128** | **103** |
| | **අනියම්/කොන්ත්‍රාත්/ආදේශක** | | | | | |
| | ප්‍රාථමික | | | | - | 01 |
| | **උප එකුතව** | | | | - | **01** |
| | **මුළු එතකුව** | | | | **953** | **582** |

තවද මෙම සේවක සංඛ්‍යාවට ආසන්න ප්‍රමාණයක් රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා නැගෙනහිර පළාත් සභාව මගින් අනුයුක්ත කොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල විවිධ අංශ යටතේ සේවය කරමින් සිටිති. වැය ශීර්ෂ 271 යටතේ පමණක් අයත්වන පිරිස ඉහතින් දක්වා ඇත.

## 07. සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවාවන්හි කාර්යය සාධනය – 2015

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සිය මහජන සේවාවන් එහි ප්‍රධාන සේවා ව්‍යාපෘති දෙකක් හරහා ඉටුකරනු ලැබේ. එනම් දිස්ත්‍රික් පරිපාලනය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරිපාලනය ලෙසයි. දිස්ත්‍රික් පරිපාලනය යටතේ අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලට සම්බන්ධ 20කට අධික වූ සේවා අංශ/ඒකක දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ පිහිටුවා ඇත. ප්‍රාදේශිය පරිපාලනය ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක් මගින් ඉටු කරනු ලබයි. ඒ අනුව මෙම සේවා අංශ දෙකේ එකතුවක් ලෙස 2015 වසරේ කාර්ය සාධනය ඉදිරිපත් කර ඇත.

### 7.1. සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවාවල ප්‍රගතිය

සාමාන්‍ය පරිපාලනය හා ආයතනික සේවා දිස්ත්‍රික් රාජ්‍ය සේවාවේ ප්‍රධානතම අංශයයි. ප්‍රමිතියට අනුකූල උසස් රාජ්‍ය සේවාවක් ලබාදීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කේන්ද්‍රකරගෙන සේවාලාභි ප්‍රඥප්තියක් ගොඩනගා ඇති අතර සේවා ලබාගැනීම පිණිස කාර්යාල පරිශ්‍රයට ඇතුළුවන ස්ථානයේ මහජනයාට පෙනෙන පරිදි ප්‍රදර්ශනය කර ඇති අතර සේවා ලබාගැනීම සඳහා එය මහජනයාට මහත් පහසුවක් ව ඇත. කාර්යලයේ සියළු සේවකයන් මෙම සේවා ප්‍රමිතීන් ඉටු කිරීමට බැඳී ඇත.

#### 7.1.1. බලපත්‍ර/අවසරපත්‍ර නිකුත් කිරීම හා අළුත් කිරීම

**ආයතන හා වගා ආරක්ෂාව සඳහා තුවක්කු බලපත්‍ර නිකුත් කිරීම**

වගා ආරක්ෂාව හා ආයතනික ආරක්ෂාව සඳහා තුවක්කු හා උණ්ඩ සඳහා බලපත්‍ර නිකුත් කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ආයතන අංශය ඉටුකරන සේවාවකි. 2015 වසර සඳහා වගා ආරක්ෂාව සඳහා තුවක්කු බලපත්‍ර 06 ක් ද, ආයතන ආරක්ෂාව සඳහා තුවක්කු බලපත්‍ර 47ක් ද, නිකුත්කර තිබුණි. එම විස්තර පහත සඳහන් පරිදි වේ. එමෙන්ම පුද්ගලික ආරක්ෂක ආයතන 01 ක් ලියාපදිංචි කිරීමද 2015 වර තුලදී සිදුවිය.

| | බලපත්‍ර නිකුත් කිරීමේ අරමුණ | නිකුත් කළ ප්‍රමාණය | පුද්ගල/ ආයතන | ආදායම |
|---|---|---|---|---|
| 1 | කෘෂි භෝග ආරක්ෂාව පිණිස | 06 | ගොවීන් සඳහා | 1,200.00 |
| 2 | ආයතනික ආරක්ෂාව පිණිස | 31 | මහජන බැංකුව | 6,520.00 |
| 3 | ආයතනික ආරක්ෂාව පිණිස | 04 | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 800.00 |
| 4 | ආයතනික ආරක්ෂාව පිණිස | 12 | වරාය අධිකාරිය | 2,400.00 |
| 5 | ආරක්ෂක ආයතන ලියාපදිංචි කිරීම | 01 | සිලෝන් සීරෝස් | 1580.00 |
| | **එකතුව** | **54** | | **10,900.00** |

### අභිං බලපත්‍ර

දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමවේදය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව 2015 වසර සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අභිං බලපත්‍ර 05 ක් අලුත් කිරීම සිදුකළ අතර හා නව බලපත්‍ර නිකුත් කිරීමක් සිදු නොවන ලදි. දිස්ත්‍රික්කයේ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ ඉල්ලීම් අනුව වාර්ෂිකව මෙම බලපත්‍ර අළුත් කිරීම හා නිකුත් කිරීම සිදුකෙරේ. මෙ සඳහා පළාත් ආයුර්වේද කොමසාරිස්ගේ පූර්ව අනුමැතිය ඉදිරිපත් කළ යුතු වේ.

| ප්‍රා. ලේකම් බල ප්‍රදේශය | බලපත්‍ර ගණන 2015 |
|---|---|
| නගර හා කඩවත් | 03 |
| මොරවැව | 02 |
| **එකතුව** | **05** |

### රා තැබෑරුම් බලපත්‍ර - 2015-2016

ත්‍රිකුණාමල දිස්ත්‍රික් ආදායම් එකතුකිරීමේ නිලධාරි ලෙස දිස්ත්‍රික් ලේකම් මගින් වෙන්දේසි කරනු ලබන රා තැබෑරුම් 3 ක් ක්‍රියාත්මක වේ. ත්‍රස්තවාදි කලබල නිමාවීමත් සමඟ මෙම දිස්ත්‍රික්කයේ රා කර්මාන්තයේ වර්ධනයක් ඇති වී තිබෙන අතර පිට පළාත් වලින් පැමිණෙන ඉල්ලුම්කරුවන් නිසා ද මේ සඳහා ඉල්ලුම වැඩි වී ඇත.

| | **රා තැබෑරුමේ නම සහ පිහිටි ස්ථානය** | **හිමිකරුගේ නම** | **වටිනාකම** |
|---|---|---|---|
| 1 | විල්ලුන්ඩි රා තැබෑරුම, විල්ලුන්ඩි | ඩබ්ලිව්.සුජානි සිල්වා | 6,502,410.00 |
| 2 | තේක්කලුත්තු රා තැබෑරුම, තේක්කලුත්තු | | 2,047,179.19 |
| 3 | නිලාවේලි රා තැබෑරුම, නිලාවේලි | | 8,685,186.83 |
| | **2015-2016 සඳහා මුළු වටිනාකම** | | **17,234,776.02** |

### පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අලුත් කිරීම

පුපුරණ ද්‍රව්‍ය සැපයුම්කරුවන් හා වෙළඳසැල් හිමියන් සඳහා පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සිදුකෙරේ. 2015 වසර සඳහා ද බලපත්‍ර 12 අලුත් කිරීම සඳහා පුපුරණ ද්‍රව්‍ය සැපයුම්කරුවන් හා වෙළඳසැල් හිමියන් ඉල්ලුම් කර තිබුණි.

| බල ප්‍රදේශය | ඉල්ලුම්කරුවන් ගණන | අයකිරීම |
|---|---|---|
| **දිස්ත්‍රික් සැපයුම්කරු - නගර හා කඩවත්** | 02 | 4,000.00 |
| **නගර හා කඩවත්** | 15 | 3,750.00 |
| **සේරුවිල** | 01 | 250.00 |
| **එකතුව** | **18** | **8,000.00** |

**නව පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර**

වෙළඳසැල් හිමියන් සඳහා නව පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර පහක් 2015 වසරේද නිකුත් කර තිබුණි. එමෙන්ම බලපත්‍ර 53 ක් අලුත් කර ඇත.

| බල ප්‍රදේශය | ඉල්ලුම්කරුවන් ගණන | අයකිරීම |
|---|---|---|
| ගෝමරන්කඩවල | 03 | 750.00 |
| **එකතුව** | **03** | **750.00** |

**පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර අලුත් කිරීම**

යුද්ධය නිමාවීමත් සමඟම දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කර්මාන්තය සීඝ්‍රයෙන් දියුණු වීම නිසා කළුගල් හා කළුගල් ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඉල්ලුම වැඩි වී ඇත. එම නිසා ගල් වල කර්මාන්තකරුවන්ගෙන් හා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගෙන් නව පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර සඳහා ලැබෙන අයදුම්පත් ප්‍රමාණය වැඩිවී ඇත. 2015 වසර සඳහා නව පුපුරණ ද්‍රව්‍ය අවසරපත්‍ර **03** ක් සඳහා ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය ලැබුණු අතර අවසරපත් 66 ක් අළුත් කර ඇත.

**පුපුරණ ද්‍රව්‍ය බලපත්‍ර අලුත් කිරීම**

| බල ප්‍රදේශය | ඉල්ලුම්කරුවන් ගණන | අයකිරීම |
|---|---|---|
| නගර හා කඩවත් | 15 | 3,750.00 |
| කන්තලේ | 18 | 4,500.00 |
| මූතූර් | 17 | 4,250.00 |
| තඹලගමුව | 01 | 250.00 |
| මොරවැව | 01 | 250.00 |
| කුච්චවේලි | 02 | 500.00 |
| ගෝමරන්කඩවල | 12 | 3,000.00 |
| **එකතුව** | **66** | **16,500.00** |

## 7.1.2. විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ විස්තර - 2015

විශ්‍රාම වැටුප් ගෙවීම කටයුතු සම්බන්ධිකරණය කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිවිල් ජනතාව උදෙසා කරනු ලබන තවත් මහජන සේවාවකි. එය ප්‍රාදේශිය ලේකම් කාර්යාල එකොළහක (11) සම්බන්ධිකරණයෙන් යුතුව සිදුකරනු ලබයි. මෙම කටයුතු සම්බන්ධිරණය දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් නිලධාරී විසින් මෙහෙයවනු ලබයි.

මධ්‍යගත දත්ත පද්ධතිය උපයෝගිකරගෙන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් 2015 වසර සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරන ලදි. 2014-10-01 වන දිනෙන් පසු විශ්‍රාම ගිය රජයේ සේවකයන් නව විශ්‍රාමිකයන්ගේ භාණ්ඩයට ඇතුලත් කර ඇති අතර 2014/10/01 දිනට පෙර විශ්‍රාම ගිය රජයේ

සේවකයන්ගේ මූලාශ්‍ර ලිපිගොනු දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමෙන් අනතුරුව ගෙවීම් සිදුකරනු ලබයි.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 05/2015 චක්‍රලේඛය අනුව විශ්‍රාම වැටුප් සංශෝධනය කිරීම ප්‍රධාන කාර්යයක් ලෙස 2015 ජූනි මස සිදු කරන ලදි. මෙහිදී විශ්‍රාමික ලිපිගොනු 3,530 වැටුප් සංශෝධනය කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල කාර්යය මණ්ඩලය විශේෂ මහන්සියක් ගන්නා ලදි. ඒ අනුව හිඟ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව අදාල ප්‍රතිපාදන වෙන් කර ඇත. පහත වගුවෙන් පෙන්වනු ලබන්නේ 2015 වසර තුලදී විශ්‍රාම වැටුප් ගෙවීම පිළිබඳ විස්තරයකි.

**විශ්‍රාම වැටුප් ගෙවීම් පිළිබඳ විස්තර - 2015**

| මාසය | විශ්‍රාමිකයන් ගණන | ගෙවූ මුදල |
|---|---|---|
| ජනවාරි | 5746 | 08,174,764.96 |
| පෙබරවාරි | 5741 | 07,989,222.64 |
| මාර්තු | 5723 | 07,126,318.54 |
| අප්‍රේල් | 5714 | 14,331,369.27 |
| මැයි | 5700 | 13,210,790.82 |
| ජූනි | 5695 | 13,284,351.47 |
| ජූලි | 5684 | 13,094,798.38 |
| අගොස්තු | 5675 | 26,687,184.45 |
| සැප්තැම්බර් | 5660 | 19,908,666.16 |
| ඔක්තොම්බර් | 5660 | 19,908,666.16 |
| නොවැම්බර් | 5643 | 19,441,781.52 |
| දෙසැම්බර් | 5451 | 16,719,228.35 |
| **එකතුව** | | **1,379,877,142.72** |

### 7.1.3. දිස්ත්‍රික් නිපුණතා සංවර්ධන ඒකකය - මානව සම්පත් හා වෘත්තීය සංවර්ධනය කටයුතු

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් නිපුණතා සංවර්ධන ඒකකය දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රය තුල ස්ථාපනය කර ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සේවය කරන කාර්යය මණ්ඩලය වෙනුවෙන් පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ. මෙම මධ්‍යස්ථානය ආරම්භ කිරීමට ප්‍රථම පුහුණු අවශ්‍යතාවක් සඳහා නිලධාරීන්ට කොළඹට යාමට සිදුවූ අතර එය අපහසුතා රැසක් ඇතිකරවන්නක් විය. දිස්ත්‍රික් නිපුණා සංවර්ධන ඒකකය මෙවන විට ක්‍රියාත්මක වන බැවින් දිස්ත්‍රික්කයේ රාජ්‍ය නිලධාරීන් ට තම දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පුහුණු මෙම මධ්‍යස්ථානයෙන් ලබාගැනීමට හැකිය. 2015 වසරේදී පැවැත් වූ පුහුණු පිළිබඳ විස්තරයක් පහත වගුවෙන් පෙන්වා ඇත.

**දිස්ත්‍රික් නිපුණතා සංවර්ධන ඒකකයේ ප්‍රගතිය - 2015**

| අ. | පුහුණු මොඩියුලය | මාධ්‍යය | පැවැත් වූ දින | සහභාගිත්වය | වියදම (රු) |
|---|---|---|---|---|---|
| 01 | සිගාස් - CIGAS | සිංහල/දෙමළ | 2015 පෙබ. 09, 10 | 29 - රා. ක. ස. | 76,640.00 |
| 02 | සේවා ආරම්භක පුහුණුව | දෙමළ | 2015 අප්‍රේල් 7,8,9, | 44 – නව රා.ක.ස. | 29,930.00 |
| 03 | එම්එස් ඔෆිස් (MS Office) | දෙමළ | 2015 අප්‍රේල් 23,24, | 18 - - රා. ක. ස. | 17,740.00 |
| 04 | කාර්යක්ෂමතා කඩයිම් විභාග පෙරහුරුව | දෙමළ | 2015 අප්‍රේල් 30 | 32 - සංවර්ධන නිලධාරී | 8,300.00 |
| 05 | කාර්යක්ෂමතා කඩයිම් විභාග පෙරහුරුව | සිංහල | 2015 මැයි 07 | 25 - සංවර්ධන නිලධාරී | 12,600.00 |
| 06 | කාර්යාල සහායක පුහුණුව | සිංහල | 2015 මැයි 25- ජූනි 08 | 14 – කා.කා.ස. | 57,850.00 |
| 07 | කාර්යාල සහායක පුහුණුව | දෙමළ | 2015 මැයි 25- ජූනි 08 | 15 – O.E.Ss | 54,650.00 |
| 08 | පේරෝල් - Payroll | සිංහල/දෙමළ | 2015 සැප්. 10 – 22 | 35 – - රා. ක. ස. | 71,120.00 |
| 09 | රා.ක.ස. පුහුණුව | සිංහල/දෙමළ | 2015 සැප්. 15 – 30 | 46 – රා. ක. ස. | 110,380.00 |
| 10 | එම්එස් පවර්පොයිට් (MS Power Point) | සිංහල/දෙමළ | 2015 සැප්. 07, 10 | 40 - රා. ක. ස. | 12,470.00 |
| 11 | එම්එස් එක්සෙල් (MS Excel) | සිංහල/දෙමළ | 2015 දෙසැ. 08 හා 11 | 40 - රා. ක. ස. | 11650.00 |
| 12 | වැටුප් පර්වර්තන හා පුද්ගල ලිපිගොනු | සිංහල | 2015 දෙසැ.14 | 25 - රා. ක. ස. | 7,350.00 |
| 13 | විනය ක්‍රියාමාර්ග හා අල්ලස් | සිංහල | 2015 දෙසැ.15 | 20 - රා. ක. ස. | 6,450.00 |
| 14 | විනය ක්‍රියාමාර්ග හා අල්ලස් | දෙමළ | 2015 දෙසැ.15 | 20 - රා. ක. ස. | 6,450.00 |
| 15 | සිගාස් 2.0(CIGAS – 2.0) | සිංහල/දෙමළ | 2015 දෙසැ.22 | 30 - රා. ක. ස. | 11,250.00 |
| 16 | රා.ක.ස. පුහුණුව | දෙමළ | 2015 දෙසැ.22 | 80 - රා. ක. ස. | 12,290.00 |

### 7.1.4. ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ලියාපදිංචි කිරීම්, සහතික නිකුත් කිරීම් ආදි කටයුතු

ප්‍රාදේශිය පරිපාලන කටයුතු ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් පවරන ලද සිවිල් ජනතාව උදෙසා වන ලියාපදිංචි කිරීමේ කටයුතු රාශියක් ප්‍රාදේශිය ලේකම් කාර්යාල විසින් සිදුකරනු ලබයි. අපගේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 11 ක් විසින් 2015 වසර සඳහා සිදු කළ එම සේවාවන් හි සාරාංශයක් පහත වගුවේ ලේඛන ගතකර ඇත.

| ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | ජාතික හැඳුනුම්පත් | උප්පැන්න සහතික | විවාහ සහතික | මරණ සහතික | වටිනාකම සහතික | ආදායම් සහතික | වාහන ලියාපදිංචිකිරීම | මහපොළ ශිෂ්‍යත්ව | ව්‍යාපාර ලියාපදිංචි කිරීම |
|---|---|---|---|---|---|---|---|---|---|
| නගර හා කඩවත් | 698 | 31,793 | 2,857 | 1,070 | 03 | 103 | - | 188 | 158 |
| පදවිශ්‍රීපුර | 241 | 4,289 | 1,268 | 366 | - | 17 | 1,754 | 10 | 15 |
| ගොරමරන්කඩවල | 268 | 4157 | 710 | 203 | - | 16 | 1,440 | 02 | 04 |
| කින්නියා | 1,672 | 16,326 | 1,724 | 293 | 1 | 34 | 8,693 | 147 | 32 |
| සේරුවිල | 492 | 2,168 | 352 | 162 | - | 30 | 2,404 | - | 10 |
| මූතූර් | 1,888 | 12,178 | 1,663 | 287 | - | - | 5,911 | - | 10 |
| කන්තලේ | 1,614 | 7,075 | 1,187 | 376 | 03 | 96 | 11,262 | 74 | 37 |
| කුච්චවේලි | 1,062 | 4,236 | 494 | 89 | 05 | 19 | 3,420 | 28 | 25 |
| මොරවැව | 311 | 1526 | 438 | 65 | - | 16 | 1178 | - | 02 |
| තඹලගමුව | 989 | 3,885 | 416 | 259 | - | 31 | 4,881 | 17 | 23 |
| වෙරුගල් | 201 | 45 | 113 | 39 | - | - | 620 | - | 01 |

### 7.1.5. කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, ත්‍රිකුණාමලය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව උදෙසා රක්ෂණ සේවාවන් ඉටු කරමින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ සිය මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි. මෙහි මූලික කාර්යභාරය වනුයේ වගා භෝග හා කිරිගවයන් සඳහා රක්ෂණ ආවරණ ලබාදීමත්, ගොවීන් සඳහා වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණාවරණ ලබාදීමත් ඒ සඳහා වන්දි ගෙවීමත්ය. 2015 වසර සඳහා ත්‍රිකුණාමලය දිස්ත්‍රික් කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය ඉටු කළ සේවාවන්හි සාරාංශයක් පහත දක්වා ඇත.

**භෝග රක්ෂණාවරණය**

| අ.අ | වගාවේ නම | ගොවීන් ගණන | භූමි ප්‍රමාණය | වාරික මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | වී (2014/2015 මහ) | 980 | 2184 | 3,549,914.37 |
| | 2015 යල | 213 | 716.50 | 1,174,292.00 |
| | 2015/2016 මහ | 574 | 1,871.90 | 3,143,474.62 |
| 02 | රතුළූණු (2014/2015) | 17 | 30.50 | 147,725.00 |
| | 2015 යල | 5 | 9 | 44,850.00 |
| | 2015/2016 මහ | 73 | 139.50 | 680,875.00 |
| 03 | අනෙකුත් කෂේත්‍ර භෝග | | | |
| | බඩඉරිඟු (2014/2015) | 10 | 40 | 90,000.00 |
| 04 | පොහොර රක්ෂණය | - | - | |
| | 2014/2015 මහ | - | - | 29,158,388.25 |
| | 2015 යල | - | - | 18,892,663.50 |

**කිරිගවයන් සඳහා රක්ෂණ ආවරණ**

| අ.අ. | සතුන් වර්ගය | සතුන් ගණන | ගොවීන් ගණන | වාරික මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | එළුවන් | 1 | 1 | 780.00 |
| 02 | ගවයන් | 33 | 28 | 62,574.70 |
| 03 | කිරිගවයන් | 135 | 134 | 52,250.00 |

**ගොවීන් සඳහා වෛද්‍ය හා හදිසි අනතුරු රක්ෂණාවරණ**

| අ.අ. | ආවරණ නම | ගොවීන් ගණන | වාරික මුදල (රු) |
|---|---|---|---|
| 01 | වෛද්‍ය රක්ෂණ | 7 | 2,525..00 |
| 02 | හදිසි අනතුරු ආවරණය | 31 | 26,660.00 |

**රක්ෂණ වන්දි ගෙවීම**

| වගාවේ නම | ගොවීන් ගණන | භූමි ප්‍රමාණය | ගෙවූ වන්දි මුදල (රු) |
|---|---|---|---|
| වී (2014/2015 මහ) | 439 | 1,464.14 | 16,259,913.00 |
| 2015 යල | 8 | 25 | 154,907.00 |
| රතු ළූණු (2014/2015 මහ) | 7 | 805 | 456,541.00 |
| බඩඉරිගු (2014/2015) | 27 | 37 | 194,600.00 |
| පොහොර රක්ෂණය | | | |
| 2014/2015 මහ | | | 124,717,919.00 |
| 2015 යල | | | 282,088.00 |

### 7.1.6. ඉඩම් පරිපාලන කටයුතු

දිස්ත්‍රික්කයේ ඉඩම් පරිපාලන කටයුතු මධ්‍යම රජයේ හා පළාත් රජයේ ඉඩම් පිළිබඳ ආයතන විසින් සිදු කරනු ලබයි. ඒ සඳහා දිස්ත්‍රික් ලේකම් යටතේ ඇති නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය (නි.ඉ.කො. කා), ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, ඉඩම් අත්පත්කරගැනීමේ කාර්යාලය හා ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල ඉඩම් අංශය මෙන්ම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය ද මූලික වී කටයුතු කරයි. ගොවිජනපද 9 ක් හා සම්බන්ධ ඉඩම් කටයුතු නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් ඉටු කරනු ලබයි. සෙසු සෑම ඉඩම් සම්බන්ධ කටයුතු සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල අනුබද්ද ඉඩම් අංශය ද ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය, ඉඩම් අත්පත්කරගැනීමේ කාර්යාලය හා පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය ද මැදිහත් වේ.

**නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය විසින් ඉටු කළ කාර්යයන්**

ජයභූමි හා රන්බිම ඉඩම් ඔප්පු ලබාදීම සම්බන්ධිකරණය කිරීමත්, ඉඩම් බලපත්‍ර හා කෘෂිකාර්මික වගාවන් සඳහා දිගුකාලීන බදු බලපත්‍ර ලබාදීමත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාලය මූලික කාර්යභාරය වන අතර 2015 දි සිදු කළ කාර්යයන්හි සාරාංශයක් පහත වගුවේ සටහන් කර ඇත.

**නි.ඉ.කො. කා. විසින් 2015 දි පැවැත් වූ ඉඩම් කච්චේරි වලින් චක්‍රලේඛ 2008/04 යටතේ ලබාදී ඇති බලපත්‍ර ගණන**

| No. | ඉඩම් කච්චේරි දිනය | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය | අයදුම්පත් ගණන | දිගුකාලීන බදු සහ අවසරපත් නිකුත් කිරීමට තෝරුණු ගණන |
|---|---|---|---|---|---|
| 01 | 10.02.2015 | සේරුවිල | සේරුනුවර | 102 | 45 |
| 02 | 27.02.2015 | සේරුවිල | නීලපොල | 120 | 59 |
| 03 | 10.03.2015 | සේරුවිල | තංගනගර් | 04 | 01 |
| | | | මහවැලිගම | 16 | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සෝමපුර | 20 | 15 |
| | | | මහින්දපුර | 11 | 04 |
| | | | දෙහිවත්ත | 05 | 03 |
| | | | ලිංගපුර | 01 | 01 |
| 04 | 24.03.2015 | පදවිශ්‍රීපුර | සේවාජනපදය | 56 | 34 |
| | | | සිංහපුර | 54 | 33 |
| | | | කාවන්තිස්සපුර | 14 | 07 |
| | | | ලස්සනගම | 05 | 03 |
| | | | ශ්‍රීතිස්සපුර | 20 | 12 |
| | | | ගැමුණුපුර | 02 | - |
| 05 | 27.03.2015 | සේරුවිල | සේරුනුවර | 97 | 60 |
| 06 | 24.05.2015 | මොරවැව | මහදිවුල් වැව | 66 | 55 |
| 07 | 04.06.2015 | මොරවැව | මහදිවුල් වැව | 60 | 56 |
| 08 | 15.09.2015 | පදවිශ්‍රීපුර | ශ්‍රීතිස්සපුර | 12 | 10 |
| | | | කාවන්තිස්සපුර | 01 | 01 |
| | | | ගැමුණුපුර | 04 | 01 |
| | | | සේවාජනපදය | 21 | 14 |
| 09 | 17.09.2015 | පදවිශ්‍රීපුර | ජයන්තිවැව | 122 | 85 |
| 10 | 18.09.2015 | සේරුවිල | මහවැලිගම | 22 | 20 |
| | | | සෝමපුර | 17 | 15 |
| | | | මහින්දපුර | 19 | 16 |
| | | | ලිංගපුර | 04 | 04 |
| | | | ලිංගපුර | 19 | 15 |
| | | | ශ්‍රීපුර | 34 | 25 |
| | | | කාවන්තිස්සපුර | 77 | 60 |
| 11 | 22.09.2015 | සේරුවිල | නීලපොල | 41 | 35 |
| | | | සෝමපුර | 21 | 18 |
| 12 | 19.11.2015 | වෙරුගල් | පූනගර් | 161 | 111 |
| 13 | 26.11.2015 | පදවිශ්‍රීපුර | සිංහපුර | 08 | 07 |
| | **එකතුව** | | | **1236** | **828** |

**දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය**

දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලයේ මූලික ඉලක්කය වනුයේ ඉඩම් පරිහරණය පිළිබඳව විද්‍යාත්මක සැලසුම් සකස් කිරීමත් තිරසාරබව හා පාරිසරික සමතුලිතතාවය ආරක්ෂාවන ලෙස තරහකාරී ඉඩම් ඉල්ලුම් සඳහා ප්‍රශස්ථ මට්ටමින් ඉඩම් වෙන්කිරීම පිණිස ප්‍රතිපත්ති නිර්දේශ කිරීමත්ය. මෙම අරමුණ පෙරදැරිකරගෙන දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කාර්යාලය 2015 වසර සඳහා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදි.

**ප්‍රධාන ක්‍රියාකාරකම්**

1. දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම,
2. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු රැස්වීම් සංවිධානය කිරීම,
3. ගම් මට්ටමින් ඉඩම් පරිහරණ ආදර්ශණ ක්‍රියාත්මක කිරීම,
4. බිම් කට්ටි මට්ටමින් ඉඩම් පරිහරණ ආර්ශණ ස්ථාපනය කිරීම,

5. හායනය වූ ඉඩම් පුනරුත්ථාපනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
6. ඉඩම් භාවිතාව පිළිබඳ වාර්තා සකස් කිරීම,
7. ඉඩම් පරිහරණ සැලසුම් පිළිබඳව ප්‍රජා සහ පසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,
8. විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම,
9. ඉඩම් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම.

**ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉඩම් භාවිතය පිළිබඳ විස්තර**

| ඉඩම් භාවිත ආකාරය | ප්‍රමාණය (හෙක්.) |
|---|---|
| ගෙවතු | 19,420.35 |
| කෘෂි ඉඩම් | 75,144.19 |
| කෘෂිකාර්මික නොවන ඉඩම් | 4,445.23 |
| කැලෑ | 139,903.00 |
| වගුරු ඉඩම් | 8,073.41 |
| වෙනත් ඉඩම් | 5,971.92 |
| ජල ප්‍රදේශ | 16,890.31 |
| මුළු එකතුව | **269,849.96** |

**මූල්‍ය ප්‍රගතිය - 2015**

| Vote | ක්‍රියාකාරකම් | ප්‍රතිපාදන මුළු එකතුව | මූල්‍ය ප්‍රගතිය | සමුච්චිත ප්‍රගතිය |
|---|---|---|---|---|
| 2105 - III | සංක්‍රමික සැලසුම් සකස් කිරීම | Rs. 75,000 | Rs. 75,000 | 100% |
| | ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම | Rs. 200,000 | Rs. 200,000 | 100% |
| | බිම්කට්ටි සැලසුම් සැකසීම | Rs. 100,000 | Rs. 100,000 | 100% |
| 2105-11 | වන රෝපණ වැඩසටහන | Rs. 100,000 | Rs. 100,000 | 100% |
| | පාසැල් හා ප්‍රජා දැනුවත් කිරීම් | Rs. 15,000 | Rs. 15,000 | 100% |
| 2105-01 | දිස්ත්‍රික් ඉඩම්පරිහරණ රැස්වීම් | Rs. 6,000 | Rs. 6,000 | 100% |
| | ප්‍රාදේශීය ඉඩම්පරිහරණ රැස්වීම | Rs. 10,500 | Rs. 10,500 | 100% |

**දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම් ප්‍රගතිය**
**(LLRC වාර්තා නිර්දේශ අනුව)**

| ක්‍රියාකිරකම | ඉලක්කය | ඒකක | ප්‍රගතිය 2015 |
|---|---|---|---|
| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ මට්ටමින් දැනුවත් කිරීම් | 11 | වැඩසටහන් ගණන | 11 |
| ඉඩම් භාවිත වර්ග කිරීම හා දත්ත රැස්කිරීම | 102 | සිතියම් ප්‍රමාණය | 102 |
| සංඛ්‍යාංකරණය හා දත්තපද්ධතිය සැකසීම | 102 | සිතියම් ප්‍රමාණය | 102 |
| අවසාන සිතියම් සැකසීම | 102 | සිතියම් ප්‍රමාණය | 102 |
| ප්‍රධාන කාර්යාලයට දත්ත භාරදීම | 102 | සිතියම් ප්‍රමාණය | 102 |
| පළමු කෙටුම්පත් වාර්තාව සැකසීම | 01 | ප්‍රමාණය | 01 |
| දිස්ත්‍රික් විශේෂඥ කණ්ඩායම් සාකච්ඡාව | 01 | ප්‍රමාණය | 01 |
| දෙවන කෙටුම්පත් වාර්තාව සැකසීම | 01 | ප්‍රමාණය | 01 |
| ජාතික විශේෂඥ කණ්ඩායම් සාකච්ඡාව | 01 | ප්‍රමාණය | 01 |
| අවසාන කෙටුම්පත් වාර්තාව සැකසීම | 01 | ප්‍රමාණය | 35% |

### 7.1.7. දිස්ත්‍රික් ඉන්ජිනේරු අංශය

